# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.01.20 පැය 0645 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/111/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**රුපියල් කෝටි විසි අටකට අධික මුදලක් හා වාහන සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය.**

2026.01.19 දින නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර නීති විරෝධි ලෙස උපයාගෙන ඇති බවට සැකකරන රුපියල් විසි අට කෝටි තිස්තුන් ලක්ෂයක (රුපියල් 283,300,000/=) මුදලක් හා වාහන දෙකක් සමඟ සැකකරුවෙකු මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත ප්‍රකාරව අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 40 ක් වන ඉබ්බාගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

විදෙස්ගතව සැඟව සිටින බවට සැකකරන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු සමඟ මෙම සැකකරු දුරකථන මඟින් සම්බන්ධතා පවත්වමින්, එම ජාවාරම්කරුගේ උපදෙස් අනුව මොහු විසින් මෙරට සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගෙන් ඉහත මුදල් එකතු කර ඇති බවට හා අදාල වාහන මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදලින් මිළදී ගෙන ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

සැකකරු 2026.01.20 දින කුරුණෑගල ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**